# ශ්‍රී ලංකාවේ පැවති මැණික් කර්මාන්තය

ඉෂාරා සුරංජි පෙරේරා
සහකාර කථිකාචාරිනී, ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

suranjiperera89@gmail.com

**සංක්ෂේපය**

මැණික් නිර්මාණය වීම වූ කලී ස්වාභාවිකව සිදුවන්නා වූ සංසිද්ධියක් වූ අතර ඈත අතීතයේ සිටම ලංකාව මැණික් නිසා ප්‍රසිද්ධියට පත්ව තිබූ බවද නොරහසකි. වර්තමානයේද අපනයනික භාණ්ඩ වලින් වැඩි මුදලක් මැණික් වලින් උපයා ගනු ලබන අතර අතීත ශ්‍රී ලංකාවේ මැණික් කර්මාන්තය පැවති බවට සාධක ඉදිරිපත් කිරීම මෙම ලිපියේ අරමුණයි.

**හැඳින්වීම**

ශ්‍රී ලංකාව මැණික් සඳහා බෝහෝ ප්‍රසිද්ධය. මැණික් ස්වාභාවික සම්පතක් වන අතරම එය ඛණිජ පවුලට අයත් වේ. ඛණිජයක් යනු ස්වාභාවික අකාබනික ක්‍රියාවලියකින් ඇතිවන සමජාතීය ඝනයක් වන අතර එහි ස්ථිර රසායනික සංයුතියක් හා ක්‍රමවත්ව සැකසුන පරමාණුක සැකැස්මක් පවතී. එහෙත් මේ සෑම ඛණිජයක්ම මැණිකක් නොවන අතර ඒ සඳහා ඛණිජයක් සතු විය යුතු ප්‍රධාන ගුණාංග (Cardinal Properties) තුනක් පවතී. එනම්,

- අලංකාරත්වය (Beauty)
- විරලතාවය (Rarity)
- කල්පැවැත්ම (Durability)

මේ ගුණාංගය සතු වන ඛණිජය මැණිකක් ලෙසට හඳුන්වන අතර කැපීමෙන් හා ඔප දැමීමෙන් සෑහෙන තරම් අලංකාරයක් ලබා ගනී ***(ප්‍රනාන්දු,පී. ආර්. කේ 2005, 04).***

වර්තමානයේ ලංකාවේ භූමි ප්‍රමාණයෙන් 20% ක මැණික් ඉල්ලම් පැතිරී ඇත. එය ලෝකයේ ඕනෑම රටක ඇති ඉහළම ප්‍රතිශතයයි. ශ්‍රී ලංකාවේ සබරගමු පළාත මැණික් සඳහා ප්‍රසිද්ධියක් උසුලන අතර අතීතයේ ද එය එසේම වූ බව පෙනී යයි. සබරගමු පළාත මැණික් සඳහා කෙතරම් ප්‍රසිද්ධියක් උසුලන්නේද යත් මේ පළාතෙන් හමුවී ඇති මැණික් අද විදේශ රටවල කෞතුකාගාර වලද ප්‍රදර්ශනයට තබා අත. ඒවා නම්,

1.Star of India (Blue) -563 Cts - American Museum of Natural History.
2. Logan Sapphire (Blue) -423 Cts - Smithsonian Institute, Washington D.C.
3.Golden Yellow Sapphire - 1794 Cts- Royal Ontario Museum, Canada.

(ධර්මරත්න, පී.ජී.ආර්, 2003, ***සබරගමුවට නම දුන් මැණික්***, සබරගමු වංශ කතාව, 395-397).

**මැණික් ඉල්ලම් පිහිටීම හා ව්‍යාප්තිය**

අවුරුදු මිලියන ගණනකට පෙර පෘථිවය තුළ බිහිවුන මැණික් සහිත පාෂාණ එනම් එනම් මැණික් නිධි (SOURCE ROCKS) සුළඟ, වැස්ස මහ හිරු රශ්මිය ආදිය නිසා ඛාදනය වීමෙන් අනතුරුව ජලධාරා මගින් පහත් බිම් කරා ගෙන යාමේ දී ජලධාරාවේ වේගය බාල වූ විට මැණික් අනෙක් ඛණිජ වර්ග වලට වඩා බරින් අධික බැවින් මුලින්ම වෙනම තැන්පත් වී ඇත. තවත් වසර මිලියන ගණනකදී මෙකී ජල ධාරා වල ගමන් මාර්ග වෙනස් වීමේදී මෙසේ තැන්පත් වූ මැණික් සහ අනෙකුත් ඛණිජ තට්ටු වලට ඉහළින් මැටි, වැලි වැනි තවත් තට්ටු තැන්පත් වීමෙන් මැණික් ඉල්ලම් සහිත බිම් නිර්මාණය වී ඇත. මෙසේ ජලධාරා මගින් ප්‍රවාහනය වීම නිසා මැණික් සහ තිරිවානා වැනි ගල්වල මූලික ස්ඵටික හැඩ ගිලිහී ගොස් රවුම් හෝ කුරුළු බිත්තර හැඩවලින් යුක්ත වේ. සමහර අවස්ථා වල අඩි දෙක තුන තරම් විශාල ප්‍රමාණයේ තිරිවානා ගල් ඉල්ලම තුළ පිහිටයි. මෙසේ ඇතිවන ඉල්ලම් ද්විතීය මැණික් නිධි (Secondary Deposits) ලෙස සැලකේ. මැණික් ගැරීම සිදුවනුයේ මේ ද්විතීය මැණික් නිධි වලය. ද්විතීය මැණික් නිධි වල මැණික් ගැරීම සඳහා ප්‍රසිද්ධ ස්ථාන රැසක් ඇති අතර ඒ ප්‍රදේශ ආශ්‍රිත කර ගනිමින් ලැබෙන මැණික් විශේෂ ද පවතී (ධර්මරත්න, පී.ජී.ආර්, 2003, ***සබරගමුවට නම දුන් මැණික්***, සබරගමු වංශ කතාව, 395-397).

- අවිස්සාවේල්ල - අඹතේස්, දියතරිප්පු, කනක, ඩයොප්සයිඩ්, අයොලයිට්
- සීතාවක - ජාගුන්, සිංහලයිට්, කෝනරූපයින්, රබහ
- ඇහැලියගොඩ - නිල්, කනක, පත්මරාග
- ගැටහැත්ත - වෛරෝඩි, රබහ, ජාගුන්, කිරිංචි
- හිඳුල්ලන - වෛරෝඩි, කිරිංචි, පසිංගල්
- කුරුවිට - නිල්, පුෂ්පරාග, පලිඟු
- හොරණ - වෛරෝඩි, රබහ, පසිංගල්, කිරිංචි, නිල්, තෝරමල්ලී
- බදුරලිය - ජාගුන්, පච්ච, පඩියන්
- රත්නපුර - නිල්, රතු, වෛරෝඩි, කනක
- මාරපන - ආරනූල්, පසිංගල්, පුෂ්පරාග, කිරිංචි
- දූල, පනගම - රත්න පුෂ්පරාග, පද්මරාග, ජාගුන්, තෝරමල්ලී, ඒකනයිට්, සිංහලයිට්, කෝනරූපයින්, රබහ, ටාෆයිට්, අඹතෙස්, ඇන්ඩලුසයිට්, සිලිමනයිට්
- පැල්මඩුල්ල - නිල්, රතු, පුෂ්පරාග, වෛරෝඩි, පසිංගල්, කනක
- කහවත්ත - රබහ, තෝරමල්ලී, ජාගුන්
- බලංගොඩ - කිරිංචි, පූනක්කන්
- කොලොන්න - නිල්, රතු, වෛරෝඩි, කනක, ඩයොප්සයිඩ්, පෙරීඩෝ, ටාෆයිට්
- ඇඹිලිපිටිය - ඩැන්බුරයිට්, ස්කපොලයිට්,සිලිමබයිට්, එන්සමටයිට්, කෝනරූපයින්

මේ මැණික් ආශ්‍රයෙන් අද මෙන්ම එදාද මැණික් කර්මාන්තය පැවතිණි.

**අතීත මැණික් කර්මාන්තය**

අද පමණක් නොව ඈත අතීතයේද මැණික් කර්මාන්තය පැවතුණ බවට ඓතිහාසික සාධක ලැබෙන නිසා මැණික් කර්මාන්තයට හිමිවන්නේ ප්‍රමුඛ ස්ථානයකි. ප්‍රධාන අපනයන භාණ්ඩයක් ලෙසට මැණික් ලොව පුරා ප්‍රසිද්ධ වී ඇත. මැණික් සම්බන්ධයෙන් මේ දිවයින කොතරම් ප්‍රසිද්ධියට පත්ව පැවතියේද යන්න සඳහන් කිරීමේදී බුදුරජාණන් වහන්සේගේ දෙවනවර ලංකාගමනය සිදුවන්නේ ද චූලෝදර, මහෝදර නාග ගෝත්‍රික රජවරුන් දෙදෙනා අතර මැණික් පුටුවක් අරභයා ඇති වූ ආරවුල සංසිඳුවීමට ය

"තසස මාතාමහා මාතු මණිපලලඞකමුතතමං
දත්වා කාලකතා නාගී මාතුලෙන තථාහි සො" ***(මහාවංසය, 1:50).***

දිව්‍යදානය හා මණිමේඛලායි යන කෘතින්ට අනුව අතීතයේ ලංකාව හඳුන්වා ඇත්තේ රත්නදීප යනුවෙනි. රත්නදීප යන්නෙහි අරුත මැණික් උපදින දිවයින යන්නයි. එමෙන්ම වාණිජ කටයුතු සඳහා මෙහි පැමිණි ඉපැරණි ග්‍රීකයන් ශ්‍රී ලංකාව තැප්‍රබෝන් යනුවෙන් හැඳින්වීමෙන් පවා ගම්‍ය වනුයේ රක්ත වර්ණ හා කහ වර්ණයෙන් යුතු මැණික් වර්ග එකල මෙරට පැවති බවයි ***(පොන්නම්පෙරුම ඩී.පී, 1961, 73).*** පසුකාලීනව ලංකාවට පැමිණි බෝහෝ විදේශිකයන්ගේ සටහන් වලද ලංකාවේ මැණික් ගැන සඳහන්ව ඇති අතර සින්බැඩ්ගේ චාරිකා වැනි ඇතැම් ජනප්‍රවාද පවා ලංකාව මැණික් නිම්නයක් ලෙස හඳුන්වා ඇත.

මේ හැරුණු කොට ලංකාවේ ශිලා ලේඛන වලද මැණික් පිළිබඳව විවිධ තොරතුරු සඳහන් වේ. පූර්ව බ්‍රාහ්මී සෙල්ලිපි වල මණිකාරවරුන් ලෙස සඳහන් වන්නේ මැණික් කර්මාන්තයේ යෙදුණු පුද්ගලයන් බව සෙනරත් පරණවිතාන පවසයි ***(මල්කාන්ති, නාලිනි, 2008, 06).*** කෝන්ගල සෙල්ලිපියේ "ගපති මණිකර තිශහ ලෙනේ සගස" යනුවෙන් මැණික් කර්මාන්තයේ නියුක්ත ගෘහපතියාගේ ලෙන සංඝයාට පූජා කළ බව ධ්වනිත වේ ***(සිංහල ශිලා ලේඛන සංග්‍රහය, 2000, 110).*** දෙමැදඹය සෙල්ලිපියට අනුව ලංකාවේ නොයෙක් පළාත් වල සංචාරය කළ මහාචූඩික රජුගේ මණිකාරයෝ ඔවුනට අවශ්‍ය මැණික් වර්ග සෙවීමෙහි නිරත වී සිටියදි මරු තුරුලට ගිය අයුරු "මවුඩි රඝශ මණිකරශෙ ශිල ඉටක කටය අගතශෙ (මචු) ගතශෙ" යන්නෙන් දක්වා තිබීමෙන් ධ්වනිත වෙතැයි සඳහන් වේ ***(සිංහල ශිලා ලේඛන සංග්‍රහය, 2000, 142).*** එමෙන්ම II

සිරිනාග රජුගේ වෙස්සගිරි ශිලාලිපියේ ද මැණික්කරුවන්ගේ ගමක් පිළිබඳව (මණිකාරග්‍රාම) තොරතුරු සඳහන් වීම තුළින් ද තහවුරු වන්නේ එකල මැණික් කර්මාන්තයට හිමිව තිබූ සුවිශේෂී ස්ථානයයි.

සිංහල පාලකයන්ගේ සමයේ පමණක් නොව ලංකාව බටහිර ජාතිකයන්ට යටත්ව පැවති සමයේදීද මැණික් ගැරීම, විකිණීම, අයිතිය, ආදායම පිළිබඳව තොරතුරු ලැබෙන අතර මේ කාලයේ දී සියලුම මැණික් රාජසන්තක වස්තුවක් වී ඇත.

මෙරට ප්‍රධාන අපනයන භාණ්ඩයක් වූ මැණික් අතීතයේ රාජකීය භාණ්ඩාගාරවල මෙන්ම ආගමික මධ්‍යස්ථාන වලද ඒකරාශි කිරීම සිදු වූ අතර, මැණික් කර්මාන්තය පැවතුණ බව පහත සාධක ඔස්සේ ඉදිරිපත් කළ හැකිය.

- රාජකීයයන්ගේ හුවමාරු භාණ්ඩයක් ලෙස භාවිත කිරීම.
- මැණික් රැස්කළ භාණ්ඩාගාර පැවති බවට සාධක හමුවීම.
- ආගමික නිර්මාණය උදෙසා මැණික් භාවිත කිරීම.
- පූජ්‍ය ස්ථාන ඉදිකිරීම සඳහා මැණික් සම්බන්ධ සිදුවීම් බලපෑම.
- ඇඳුම් පැළඳුම් නිර්මාණය සඳහා මැණික් භාවිත කිරීම.

අතීතයේ පටන් මැණික් රාජකීයයන්ගේ හුවමාරු මාධ්‍යයක් ලෙසට භාවිත කළ බවට සාධක ලැබේ. මහාවංසයට අනුව කුවේණිය පළවා හැරි විජය රජු තම අභිෂේකය උදෙසා ඉන්දියාවේ මදුරා පුරයෙන් කුමරියක් ගෙන්වා ගැනීමේදී තුටු පඬුරු වශයෙන් යවා ඇත්තේ මැණික් ය.

"පණ්ණකාරෙ මහාසාරෙ මණිමුත්තාදිකෙ බහු
ගාහාපයිත්වා පාහෙසුං දක්ඛිණ මධුරං පුරං" ***(මහාවංසය, 07:49)***

එසේම දේවානම්පියතිස්ස රජ දවස ද ඔහුගේ පින් මහිමයෙන් නව රත්න මැණික් ජාතීහු පොළොවෙන් මතු වූ බවත්, ඔහු ඉන්දියාවේ අශෝක අධිරාජයා වෙත මේ ඉන්ද්‍රනීල, වෛදූර්ය, රතු කැට වැනි විවිධ වර්ගවලට අයත් වූ මැණික් තුටු පඬුරු වශයෙන් යැවූ බවත් සඳහන් වේ.

"ඉන්දනීලං වෙළුරියං ලොහිතඞ්කමණි ච්'මෙ
රතනානි පනෙතානි මුත්තාතා, තාච යටඨීයො" ***(මහාවංසය, 11:16)***

සාහිත්‍යය මූලාශ්‍ර වන සඳහන් මේ සාධක අනුව මුල් යුගයේ පටන් මැණික් රාජකීයයන්ගේ හුවමාරු මාධ්‍යයක් ලෙසට භාවිත කරන ලද බවට සාධක හමුවෙයි.

අතීතයේ මැණික් රැස් කළ භාණ්ඩාගාර පැවති බවට ද සාධක හමුවෙන අතර ඒවායේ අයිතිය රාජකීයයන්ට පමණක් නොව භික්ෂූන්ට ද හිමිව පැවති බව ෆාහියන්ගේ දේශාටන වාර්තාවෙන් හෙළිවේ. "මේ රාජධානිය ආරම්භයේ සිටම මෙතෙක් දුර්භික්ෂයකට හෝ වෙනත් බරපතල උපද්‍රවයකට ගොදුරු නොවීය. මෙහි වසන භික්ෂු සංඝයාගේ භාණ්ඩාගාර මණි ආදී විවිධ වූ මහාර්ඝ රත්න විශේෂයන්ගෙන් පිරී පවතී" ***(ෆාහියන්ගේ දේශාටන වාර්තාව, 1999, 94).*** මේ භාණ්ඩාගාරය තමන්ට අයත් කර ගැනීමට අදහසක් රජුට පහළ වන අතර පසුව සිය අදහස ඉවත් කරගත් රජු භාණ්ඩාගාරය ආරක්ෂා කර ගන්නා ලෙසට භික්ෂූන්ට මෙලෙස දන්වයි. "කිසි කලෙකත් රජෙකුට ඔබවහන්සේගේ භාණ්ඩාගාරය නැරඹීමට ඉඩ නොතැබීමටත්, යටත් පිරිසෙයින් සසුන් ගතවැ අවුරුදු 40ක්වත් නොඉක්මවූ භික්ෂු නමක් ඒ ඇතුළට වැද්ද නොගැනීමටත් කතිකාවක් සම්මත කරගනු ඇතැයි මම බලාපොරොත්තු වෙමි" යි යනුවෙන් රජු භික්ෂූන්ට දැන්වීය ***(ෆාහියන්ගේ දේශාටන වාර්තාව, 1999, 94).***

ආගමික නිර්මාණ උදෙසා මැණික් භාවිතා කිරීමේ අරමුණින් හෝ විදේශ රටවල් සමඟ ආගමික සබඳතා ඇතිකරගැනීමේදී හුවමාරු මාධ්‍යයක් ලෙස භාවිත කිරීමේ අරමුණින් හෝ මෙලෙස භික්ෂූන් සතුව මැණික් භාණ්ඩාගාර පැවතුණායැයි අනුමාන කළ හැකිය. මෑතකදී තිස්සමහරාම ලුණුගම්වෙහෙර ප්‍රදේශයේ එකම ස්ථානයකින් මැණික් බහුලව හමුවූ අතර ඒ ප්‍රදේශය ආශ්‍රිතව අතීතයේ මැණික් භාණ්ඩාගාරයක් පැවතුණාදැයි සැකයක් මතුවේ.

පුරාණයේ ආගමික නිර්මාණ උදෙසා ද මැණික් භාවිත කළ බවට සාධක හමුවෙයි. අතීතයේ බුද්ධ ප්‍රතිමා නිර්මාණයේදී ඒවායේ විවිධ අංගෝපාංග සඳහා මැණික් භාවිත කර ඇත. අභයගිරි විහාරයේ වූ සල පිළිමයෙහි නේත්‍රා වලට හතරවෙනි සියවසේ දී පමණ බුද්ධදාස රජතුමා විසින් මැණික් ඔබ්බවා තිබූ බවට සාධක හමුවේ.

"සිලාමයාය සමබුදධපටිමාය අකාරයි
මණිතං නයනං රාජා විහාරෙ අභයුතතරේ" ***(මහාවංසය, 37:123)***

බුද්ධදාස රජතුමා විසින් මැණික් ඔබ්බවා තිබූ මේ පිළිමයෙහි නේත්‍රයනට ධාතුසේන රජතුමා විසින් මාහැගි මිණි සඟලකින් නෙත් තැබූ බවද සඳහන් වේ.

"බුදධදාසකතෙ නෙතෙත තටෙඨ නගසමණිඑයං
අකාසි නෙතතං සඤුසස රංසිචූළාමණිං තථා " ***(මහාවංසය, 38:62)***

නෙත්වලට පමණක්නොව බුදු පිළිම වටා වූ රශ්මි මාලාවටද මැණික් ඔබ්බවා තිබූ බවට සාධක ලැබේ. ධාතුසේන රජතුමාගේ රාජ්‍ය සමයේ නිර්මාණය කරන ලද මැණික් ඔබ්බවූ රුස් වලල්ලක් පිළිබඳව සාධක හමුවේ.

"මණිහි සනනීලෙහි කෙසාවතතංසුමුතතමං
හෙමපටටං තථෙවුණණලොමං සොවණණදීවරං" ***(මහාවංසය, 38:63)***

ක්‍රි.ව. 4 වැනි සියවසේ ලංකාවට පැමිණි ෆාහියන් භික්ෂුව අභයගිරි විහාර සංකීර්ණයේ මැණික් ඔබ්බවා නිර්මාණය කරන ද ආගමික නිර්මාණ පිළිබඳව සිය වාර්තාවලද සඳහන් කර ඇත.

"මේ ස්තූපයේ එක් පසක අභයගිරි නම් සංඝාරාමය වෙයි. එහි භික්ෂූහු 5000ක් පමණ වාසය කරති. බුදුන් වැඳීම සඳහා මේ සංඝාරාමයෙහි රන් රිදී කැටයමින් හා මහාර්ඝ මාණික්‍ය එබ්බීමෙන් අලංකෘත වූ විශාල ශාලාවක් තිබේ. මෙහි හරිත වර්ණ මෘත්තිකා විශේෂයකින් නිමවන ලද අඩි 22ක් අස වැඩ සිටිනා ලද බුදු පිළිමයක් වෙයි. සම්පූර්ණ ප්‍රතිමාව සප්ත රත්නයෙන් කාන්ති විහිදුවමින් බබළයි. එහි දීප්තිය හා ආනුභාවය වර්ණනා විෂය අතික්‍රාන්ත කොට සිටී. මේ බුද්ධ ප්‍රතිමාවේ දකුණු අතේ මිල කළ නොහැකි තරම් වටිනා මුතු ඇටයක් වේ" ***(ෆාහියන්ගේ දේශාටන වාර්තාව, 1999, 93).***

ඉන්දියාවේ සංචාරයක යෙදුණ චීන ජාතික හියුංසාංගේ වාර්තාව තුළින් ද මෙරට ආගමික නිර්මාණ උදෙසා මැණික් යොදා ගත් බවට සාධක ලැබේ. ''අනුරාපුර රාජමාළිගයට නුදුරු තැන මහා දළඳා මැදුරයි. එහි මුදුන වූ රන්කොතේ මහා පද්මරාග මාණික්‍යයකි. මේ මිණි රන් තරුවක් සේ බොහෝ ඈතට පෙනේ. මෙහි සුවඳ දුම් ආදිය සඳහා ගන්නේද මැණික් එබ්බවූ රන් භාජනයි" ***(හියුංසාංගේ භ්‍රමණ වෘත්තාන්තය, 1961, 314).***

මේ මැණික් ඔබ්බවා නිර්මාණය කරන ලද බුද්ධ ප්‍රතිමා රැසම මැණික් ගල් ආක්‍රමණිකයන් විසින් මෙර ආක්‍රමණය කළ අවස්ථාවන්හිදී පැහැරගෙන ගොස් තිබේ. බුද්ධ ප්‍රතිමා සඳහා පමණක් නොව ස්ථූප නිර්මාණයේදී ද මැණික් ගල් භාවිත කළ බවට සාධක හමුවේ. දුටුගැමුණු රජතුමා රුවන්වැලි සෑය තැනීමේදී නිධන් වස්තු ලෙස මැණික් තැන්පත් කළ බව මූලාශ්‍රයේ සඳහන් වේ ***(සිංහල ථූපවංසය, 2005, 163-164).***

ස්ථූප තැනීමේදී රජවරුන් බොහොමක් මෙලෙසින් අගනා මැණික් නිධන් කළ බවට සාධක මූලාශ්‍රය පිරික්සීමෙන් වාර්තා වේ. ස්ථූපයන්ගේ කොත සඳහා ද භාවිත කරනු ලැබුවේ අර්ධ මාණික්‍යයන් සේ හඳුන්වනු ලැබූ පළිඟු ගල් ය. පළිඟු ගල් අකුණු සන්නායකයක් ලෙසින් ක්‍රියා කරන්නට වීම නිසා රජවරුන් ස්ථූපයේ කොත මුදුනට පළිඟු ගලක් එක් කළ බවට මූලාශ්‍රමය සාධක ලැබෙන අතර සංඝතිස්ස රජතුමා විසින් රුවන්වැලිසෑයේ කොත මුදුනට පළිඟු ගලක් සවි කළබව සඳහන් වේ.

මජෙඣ චතුනනං සුරියානං ධපාපෙසි මහීපති
ථූපසස මුදධනි තථා'නතථං වජිරචුමබටං" ***(මහාවංසය, 36:66)***

පොළොන්නරු රාජධානි සමයේ I විජයබාහු රජ දවස ද ශ්‍රී පාදස්ථානයේ ඇති සිරිපතුල් ගල වටා මැණික් ගල් ඇතිරූ බව අඹගමුව සෙල්ලිපියේ "මන කසසපෙ ගෞතමයැ සිවු බුදුන් සරණ තඹුරු දා මුදුනෙන් ඉසිලු සමනොළකුළෙහි පිහිටි පදලස් දා පිහිටි විසිතුරු සත්රුවනින් සැදුණු" යනුවෙන් සඳහන් වේ ***(Epigraphia Zeylanica, Vol II,211-212).***

එමෙන්ම මෙරට ආගමික නිර්මාණ උදෙසා පමණක් නොව අසල්වැසි රාජ්‍යයන් වල ආගමික නිර්මාණ උදෙසා ද මෙරටින් මැණික් යැවූ බව සඳහන් වේ. ගම්පොල රාජධානි සමයේ සේනාලංකාධිකාර සෙනෙවි මුතු මැණික් යවා ඉන්දියාවේ කාංචිපුරයේ පිළිම ගෙයක් කරවූ බව සඳහන් වේ ***(නිකාය සංග්‍රහය හෙවත් ශාසනාවතරණය, 2001, 39).***

මේ හැරුණුකොට මැණික් ඔබ්බවා කරන ලද නිර්මාණ පිළිබඳ ජනප්‍රවාදගත තොරතුරු පවතී. දළදා වහන්සේ දෙල්ගමුව රජමහා විහාරයේ තැන්පත් කොට තිබෙන අවස්ථාවේ කුරුවිට ප්‍රදේශයෙන් ලැබුණු විශාල නිල් මැණිකකින් ඒ සඳහා කොපුවක් නිර්මාණය කළ බවද එය සොරුන් පැහැර ගනී යැයි බියට පත් රජ පසුව එය වැසී යන පරිදි ඇත්දළින් කොපුවක් නිර්මාණය කළ බවද ජනප්‍රවාදයේ පවතී.

බෞද්ධාගමික නිර්මාණ උදෙසා පමණක් නොව හින්දු ආගමික නිර්මාණ උදෙසා ද මැණික් භාවිත කළ බවට සාධක හමුවෙයි. මෑතකදී රත්නපුර හිදැල්ලන පැරඩයිස් ප්‍රදේශයේ පතලක් හාරන අතරතුරේදී හමුවූ ශිව ලිංගය ඊට නිදසුනකි. ශිව ලිංගය හින්දු ආගමේ පූජා වස්තුවක් ලෙස සැලකේ.

තවමත් කාල නිර්ණය කොට නොමැති මේ ශිව ලිංගයට මැණික් ඔබ්බවා තිබූ බවට සාධක ලැබෙන අතර දැනට මෙය රත්නපුර ඊශ්වර කෝවිලේ තැන්පත් කොට ඇත.

ඇතැම් පූජ්‍ය ස්ථාන ඉදිකිරීම සඳහා ද මැණික් සම්බන්ධ සිදුවීම් බලපා ඇති බව පෙනේ. රත්නපුර සමන් දේවාලයට ඊට නිදසුනකි. දඹදෙණි යුගයේ සිටි II පරාක්‍රමබාහු රජුගේ ඇමතිවරයෙක් වූ දේවපතිරාජ පරාක්‍රමබාහු රජුගේ ඇරයුමක් පරිදි රත්නපුරයට පැමිණෙනුයේ මැණික් ගැරීම සඳහාය. එහිදී ඔහු තම අරමුණු ඉටු වුවහොත් රත්නපුර ප්‍රදේශය භාර සමන් දෙවියන් වෙනුවෙන් දේවාලයක් තනන බවට භාර වී තිබේ. ඔහුගේ එම අරමුණ ඉටුවීමෙන් පසු තම භාරය ඔප්පු කරනු වස් සමන් දේවාලයට එම භූමියේ ගොඩනංවා ඇත. මේ සිදුවීම ඔස්සේ මැණික් ගැරීම සම්බන්ධව රාජකීයයන්ගේ මැදිහත්වීම පැවති බව හඳුනාගත හැකිය.

ඇඳුම් ආයිත්තම් සැරසීම පිණිස පුරාණයේ මැණික් භාවිත කළ බවට සාධක හමුවේ. රජවරුන් තම ඇඳුම් පැළඳුම් අලංකාරවත්ව කර ගැනීම සඳහා මැණික් බහුල වශයෙන් භාවිත කර ඇත. රජවරුන්ගේ සිව්සැට ආභරණ වලින් වැඩි ප්‍රමාණයක් මැණික් වලින් අලංකාර කර තිබී ඇත. නිශ්ශංකමල්ල රජුගේ වාන් ඇළ ශිලා ලිපියට අනුව රජුට රතු , නිල් මරකත, පුෂ්පරාග, ගෝමේද, වෛඩූර්ය ආදී වූ මැණික් වලින් ආභරණ පැවති බව සඳහන් වේ ***(Epigraphia Zeylanica, Vol II, 151).*** රාජකීයන් බහුලව ආභරණ සඳහා මැණික් භාවිත කළ බවට සාධක ලැබෙනුයේ කන්ද උඩරට රාජධානි සමයේදී ය. ඩේවි සඳහන් කරන පරිදි කන්ද උඩරට රජු උත්සවයන්හි දී අති විචිත්‍ර සාටකයන්ගෙන් හා ආභරණ වලින් සැරසී සිටි බවත් ඒවා අලංකාරකර තිබී ඇත්තේ රක්ත හා මරකත මැණික් වලින් බවත් සඳහන් කරයි ***(ඩේවි දුටු ලංකාව, 2005, 151).*** සිව්සැට ආභරණ වලින් සුවිශේෂී ස්ථානයක් ඔටුන්නට හිමිවන බැවින් රජවරු ඔටුන්නට මැණික් ගත් එබ්බවීම ආභරණයක් කර ගත්හ. I විජයබාහු රජතුමා ස්වකීය ඔටුන්න මැණික් වලින් සරසා තිබූ බව සඳහන් වේ ***(Epigraphia Zeylanica, Vol II,211-212).*** කන්ද උඩරට රාජධානි සමයේදී ද රජවරුන් තම හිස පැළඳි ඔටුන්න සැරසීම සඳහා භාවිත කළේ මැණික් ය. කොළඹ කෞතුකාගාරයේ මහජන ප්‍රදර්ශනයට තබා ඇති ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ ඔටුන්න වර්තමානයේ අපට විද්‍යමාන වන හොඳම උදාහරණයකි. ජෝන් ඩේවි සඳහන් කරන ආකාරයට "මහනුවර අන්තිම රජුට දියමන්ති රතු මැණික් හා මරකත අල්ලන ලද ඔටුන්නක් විය" ***(ඩේවි දුටු ලංකාව, 2005, 156).*** මීට අමතරව රජුගේ සිංහාසනය, කඩුකස්ථාන ඇතුළු ස්වර්ණාභරණ ද මැණික් වලින්

අලංකාර කොට තිබූ බවට සාධක හමුවේ ***(ඩේවි දුටු ලංකාව, 2005, 156 ).*** මේ ආකාරයට රාජකීයන් තමන්ට රිසි පරිදි සිය අලංකාර කටමයුතු සඳහා මැණික් භාවිත කළ බවට සාදක හමුවේ.

ඇතැම් ප්‍රභූ කාන්තාවෝ ද තම ආභරණ අලංකාර කර ගැනීම උදෙසා මැණික් භාවිත කළ බවට සාධක හමුවේ. සීගිරි සිතුවම්හි සීගිරි අප්සරාවන් මැණික් යොදා කළ ආභරණ පැළඳි බවට සාධක හමුවේ. සීගිරියෙන් හමු වූ මැණික් එබ්බවූ කුණ්ඩලාභරණය මගින් ද සනාථ වන්නේ අතීතයේ මැණික් භාවිතය පිළිබඳවය. මෙම කුණ්ඩලාභරණයට මැණික් ගල් 5 ක් පමණ අල්ලා තිබෙන්නට ඇතැයි අනුමාන කරන අතර, එයින් කිහිපයක් දැනටත් ඉතිරිව පවතී. මෙරටට පැමිණි අරාබි ජාතික ඉබන් බතුතා සඳහන් කර ඇත්තේද මෙරට කාන්තාවන්ගේ පළඳනා සඳහා මැණික් යොදා ගත් බවය. එමෙන්ම ඇතුන් සැරසීම සඳහාද විවිධ ප්‍රමාණයේ මැණික් යොදා ගත් බවයි.

සන්දේශ කාව්‍යය වලින්ද එකී යුගයේ කාන්තාවෝ තම ඇඳුම් පැළඳුම් උදෙසා මැණික් එක් කරගත් බවට සාධක ලැබේ.

තනා පබළු මුතු මිණි අබරණ පැළඳ
පිනා සඳලුවල සිටි සුරඟනෝ ලද
මනා ළපලු පත්මල් පලගෙන නොමඳ
කනා ලියන් වැනි රැඳිනින් ගිරි බෙයද ***(ගිරා සන්දේශය,23 කව)***

ලකළ පුළුලුකුලැ බඳ මිණි මෙවුල්ලා
සමඟ රන් සලඹ රැවු දී වෙවුල්ලා ***(සැලළිහිණි සන්දේශය, 75කව)***

ගවසා සුපුල් කඩුපුල් මල් නිල් වරල
සලසා උකුළු වට රසුදුල මිණි මෙවුල ***(සැලළිහිණි සන්දේශය, 44කව)***

පෘතුගීසි පාලන සමයේ දී ද මැණික් භාවිතය පිළිබඳ තොරතුරු රාශියක් ලැබෙන අතර ඒ යටතේ මැණික් ගැරීම, අයිතිය, මැණික් කැපීම, මැණික් භාවිතය සම්බන්ධ නීති රීති, පිළිබඳව තොරතුරු හමුවේ. මෙම කාල වකවානුවේ සියලුම මැණික් රාජසන්තක වස්තුවක් බවට පත්ව ඇත. පෘතුගීසි පාලන සමයේ දී ප්‍රධාන වශයෙන් මැණික් ගැරීම සිදුගොට ඇත්තේ දෙනවකට අයත් ගම් කිහිපයක වූ අතර පුෂ්පරාග, වෛරෝඩි, පද්මරාග ආදී මැණික් ඉන් ලැබී ඇත. මැණික් ගැරීම භාරව රජය විසින් පත් කරන ලද නිලධාරි මඩුල්ලක්ද සිටි බව සඳහන් වේ. " මැණික් ලබා දෙන ගම් විසි පහක් පමණ සබරගමුවේ ඇත. මේවායේ වැඩ කෙරෙන්නේ අවුරුද්දට දින පහළොවක් පමණි. මේ සම්බන්ධයෙන් ආකර විදානේ නම් ගම් ප්‍රධානියෙක් ද ඔහුගේ සහායට මොහොට්ටාල කෙනෙක්ද මැණික් ගරන සෑම ගමකට මුලාදෑනියෙක්ද කනකපුල්ලේ කෙනෙක්ද" සිටි බව සඳහන් වේ ***(රිබෙයිරෝගේ ලංකා ඉතිහාසය, 2003, 107).*** පෘතුගීසි වාර්තාවන්ට අනුව මේ මැණික් ලබා ගැනීමෙන් පසු මැණික් ගල් කපා ඔප දැමීම පිණිස අගනුවරට ගෙන යනු ලැබූ බවත් ඉන් පසු අලංකාර ලෙස සකස් කරන ලද මැණික් වෙන්දේසි කිරීමට කටයුතු කළ ආකාරයත් සඳහන් කර ඇත. ***(රිබෙයිරෝගේ ලංකා ඉතිහාසය, 2003, 107).***

කන්ද උඩරට රාජධානි සමයේ දී මැණික් භාවිතය පිළිබඳ තොරතුරු රාශියක් ලැබෙන අතර, මැණික් ගැරීම, අයිතිය, මැණික් කැපීම, මැණික් භාවිතය සම්බන්ධ නීති රීති, පිළිබඳවද සඳහන් වේ. මැණික් ගැරීමේ අයිතිය රජු යටතේ වූ බව දක්වන ඩේවි මැණික් ලබා ගන්නා ආකාරය පිළිබඳව සඳහන් කරන්නේ මෙසේය. " ලංකාවේදී මෙතෙක් මේ දුර්ලභ ශෝභමාන ඛණිජ සොයා ගන්නා ලද්දේ ගංවතුර පසෙහිය. මැණික් ලැබේයැයි අනුමාන කළ හැකි තැන්වල අඩි තුනේ සිට විස්ස තෙක් ගැඹුරු පතල් හාරනු ලැබේ. මැණික් වැඩි වශයෙන් හමුවන්නේ ගොරෝසු වැලි හා බොරලු අතරේය. මේ වැලි බොරලු ගස්කොට කුඩ මගින් අසල පිහිටි දිය පාරකට ගෙන ගොස් මනාව සෝදනු ලැබේ" ***(ඩේවි දුටු ලංකාව, 2005, 237).*** මැණික් ගැරූ පසුව අඹතෝස්ත, රතු තිරුවාන පුෂ්පරාග, වෛරෝඩි, තෝරමල්ලි, රබහ, දියමන්ති, පද්මරාග, කිරිංචි, නිල්මිණි, කොරොන්ඩම්, ගෝමේද ආදී වටිනා මැණික් මෙන්ම අර්ධ වටිනාකමින් යුක්ත මැණික් ලැබුණු බව සඳහන් කරයි ***(ඩේවි දුටු ලංකාව, 2005, 257).***

මැණික් ගැරීම මෙන්ම මැණික් කැපීමද නුවර යුගයේදී බහුලව සිදු වූ බවද සිංහලයෝ ඒ සඳහා විශේෂ චාතුර්යයක් දැක්වූ බවද කැපීමෙන් හා ඔප දැමීමෙන් සකස් කරගත් මැණික් පැළඳීම මහනුවර රාජ සභාවේ විලාසිතාව වූ බවද ඩේවි සඳහන් කරයි ***(ඩේවි දුටු ලංකාව, 2005, 237).*** නුවර යුගයේ මැණික් කැපීමට භාවිත කළ උපකරණය ඇත් දත් ලියවන්නන්ගේ ලියනකඳට සමාන උපකරණයක් බවත් ලියනකඳේ වැලි කුඩු සහිත තඹ තහඩුවක් වූ බවත් මෙය කරවන ලද්දේ දුන්නකින් බවත් සඳහන් වේ ***(කුමාරස්වාමි, 2004, 146).***

මේ මූලාශ්‍රගත තොරතුරු හැරුණු කොට මැණික් සම්බන්ධ ජනප්‍රවාද පුවත්ද පවතී. මැණික් සම්බන්ධයෙන් වඩාත් ප්‍රචලිත රත්නපුර ප්‍රදේශයේ ජනයා අතර මැණික් සම්බන්ධ ජනප්‍රවාද රැසකි. වර්තමානයේද රත්නපුර ප්‍රදේශය ආශ්‍රිත ජනතාවගේ ප්‍රධාන ජීවන වෘත්තිය මැණික් කර්මාන්තයයි. කළු ගඟ ආශ්‍රිතව මොවුහු මැණික් ගැරීමේ කටයුතු වල නිරත වන අතර කළු ගඟේ වක්කලම් ආශ්‍රිතව මැණික් බහුලව ඇතැයි යන්න මොවුන්ගේ මතයයි. ඊට හේතු ලෙස මොවුන්ගේ පිළිගැනීම වන්නේ ඉන්දියාවෙන් පැමිණි මුක්කරුවන් නමින් හැඳින්වූ ජන කොටසක් සබරගමු පළාත භාර සමන් දෙවියන් වෙත භාර වී කළු ගඟේ මැණික් ලබාගත් බවත් පසුව ඇතිවූ අධික ආශාව නිසා පොරොන්දු වූ පරිදි භාරය ඉටු නොකොට හොර රහසේ පාරු හතක මැණික් පුරවා ගඟ දිගේ පහළට යාමට තැත් කිරීමේදී සිය ප්‍රයත්නය වැරදී වක්කලම් හතකදී මේ පාරු ගිලී ගිය බවට විශ්වාස කරන අතර මේ විශ්වාසය මත සිට අදටද වක්කලම් ආශ්‍රිතව මැණික් සොයා කිමිදෙන පිරිස් දැකගත හැකි අතර පුදුමයට කරුණනම් අධික වටිනාකමකින් යුතු මැණික් වක්කලම් පතුලෙන් හමුවීමයි.

**නිගමනය**

මේ තොරතුරු වලට අනුව ගම්‍ය වන්නේ ලංකාවේ මැණික් කර්මාන්තය අද පමණක් නොව ඈත අතීතයේ සිටම පැවත එන බවයි. එදා සිට අද දක්වා ප්‍රධාන අපනයන භාණ්ඩයක් වූ මැණික් රාජකීයන්ගේ හා ප්‍රභූන්ගේ ආභරණ නිර්මාණය උදෙසාද රාජකීය භාණ්ඩාගාර වල තුටුපඩුරු වශයෙන්ද ආගමික අංශයේ නිර්මාණ උදෙසාද යොදා ගත්තා පමණක් නොව එදා සිට අද දක්වා ලක්මාතාවට ජාතික හා ජාත්‍යන්තර වශයෙන් සුවිසල් කීර්තියක් ලබා දීමට සමත් වූ ස්වාභාවික තිළිණයක්ම වූ බවයි.

***ආශ්‍රිත ග්‍රන්ථ***

*ඩේවි දුටු ලංකාව*, (2005), (අනු) සෝමරත්න, ඇල්ලේපොළ, විසිදුනු ප්‍රකාශකයෝ, බොරලැස්ගමුව.

*ගිරා සන්දේශය,* (2006), (සංස්) ප්‍රේමරත්න, කේ.පී , ප්‍රදීප් ප්‍රකාශකයෝ, කොළඹ.

*මහාවංසය*, (1959), (සංස්) බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, ඇම්.ඩී ගුණසේන සමාගම, කොළඹ.

*සිංහල ථූපවංසය*, (2005), (සංස්) කරුණාතිලක ඩබ්.ඇස්, ඇම්.ඩී ගුණසේන සමාගම, කොළඹ.

*සැළලිහිණි සන්දේශය,* (1999), අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

*හියුං සියැන් භ්‍රමණ වෘත්තාන්තය,* (1999), (සංස්) බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, ඇම්.ඩී ගුණසේන සමාගම, කොළඹ.

*ෆාහියන්ගේ දේශාටන වාර්තාව*, (1999), බලගල්ලේ, විමල්, විසිදුනු ප්‍රකාශකයෝ, බොරලැස්ගමුව.

*EPIGRAPHIA ZEYLANICA*, (vol II), 1928,Vickramasignhe, Don Martino,De Zilva, Oxford University press, London.

*EPIGRAPHIA ZEYLANICA*, (vol III), 1933, Paranavitana, S., Oxford University press, London.

කුමාරස්වාමි, ආනන්ද, (1994), *මධ්‍යකාලීන සිංහල කලා*, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව.

මල්කාන්ති, නාලිනි, (2008), *පබළු නිර්මාණය*, මධ්‍යම සංස්කෘතික අරමුදල.

මුදියන්සේ, නන්දසේන, (2000), *සිංහල ශිලා ලේඛන සංග්‍රහය*, ගොඩගේ සහ සහෝදරයෝ කොළඹ.

මේධානන්ද හිමි, එල්ලාවල, වජිරබුද්ධි හිමි, මඩලගම, (සංස්), (2003), *සබරගමු වංශ කතාව*, සබරගමු පළාත් සභාව.

පොන්නම්පෙරුම, ඩී.පී, (1961), විදේශිකයන් දුටු පුරාණ ලංකාව , ආර්ය මුද්‍රණාලය, මහනුවර.

ප්‍රනාන්දු, පී.ආර්.කේ (2005), *මැණික් : එහි කලාව හා විද්‍යාව*, විද්‍යා ව්‍යාප්ති ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය.

රිබෙයිරෝ, ජෝ. ආ. ඕ., (2003) *රිබෙයිරෝගේ ලංකා ඉතිහාසය*, (පරි) රුබේරු ටී. කේ ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.